DSK/DMC/KEG/PREPA/A1/1

# 2020.05.16 දින ඇති වූ ගංවතුර ආපදා තත්ත්වය පිළිබඳ සාරාංශ වාර්තාව - කෑගල්ල දිස්ත්‍රික්කය

උක්ත කරුණට අදාළව කෑගල්ල දිස්ත්‍රික්කයට 2020.05.15 සහ 16 යන දෙදින තුළ ඇදහැලුණු අධික වර්ෂාව නිසා ඇති වූ දෛනික තත්ත්ව වාර්තා සාරාංශය මෙසේ ඉදිරිපත් කරමි.

2020.05.15 දින පෙ.ව. 8.30 සිට 2020.05.16 දින පෙ.ව. 3.00 දක්වා කාලය තුළ වර්ෂාපතනය -

කෑගල්ල දිස්ත්‍රික්කය , ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය - **මි. මී. 212**

මේ සමඟ ක්ෂණිකව ඇති වූ දැඩි වර්ෂාව මගින් කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි සිදු වූ හානිය පිළිබඳ 2020 මැයි මස 16 , 17 හා 18 දිනයන්හි ආපදා තත්ත්ව වාර්තා මේ සමඟ යොමු කරමි.

එම ආපදා තත්ත්වයන් කළමනාකරණය කිරිම සඳහා දිස්ත්‍රික් ලේකම්තුමාගේ හා ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ උපදෙස් මත අවශ්‍ය කළමනාකරණ කටයුතු සිදු කරන ලදි. මුදවා ගැනිමේ කටයුතු සඳහා බෙරගල යුධහමුදා කඳවුරේ 611 බල සේනාධිපතිගේ අධීක්ෂණයෙන් 583 බලඇණිය හා හිරිවඩුන්න විශේෂකාර්ය බලකා මුලස්ථානයේ බට පිරිස් සහභාගි විය. කෙසේ නමුත් මේ ව්‍යසනය සමඟ ජීවිත 02 ක් අහිමි විය.

| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ආපදාව සිදු වූ දිනය හා වේලාව | ආපදාව | මිය ගිය සංඛ්‍යාව | මියගිය පුද්ගලයාගේ නම | ලිපිනය | වයස |
|---|---|---|---|---|---|---|
| ගලිගමුව | 2020.05.16 අලුයම 5.00 | දියේ ගිලීම් | 01 | ලයනල් විජේසිංහ මයා | අංක 32, ෆොසාපිල්ඩ්, ඉඹුල්ගස්දෙනිය | අවු. 48 |
| කෑගල්ල | 2020.05.16 පෙ.ව. 8.00 | කණ්ඩි කඩා වැටීම් | 01 | සේනානායක රාලලාගේ ඉන්ද්‍රනි සේනානායක මිය | උදෑසන සේනානි, වල්දෙනිය, කෑගල්ල | අවු.76 |

එමෙන්ම ගලිගමුව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ ගුරුගොඩ ඔය, ගලිගමුව ඇළ හා ගලිගමුව ඇළට සම්බන්ධ අතුරු ඇළ මාර්ග ආශ්‍රිතව ඇති ග්‍රාම සේවා වසම්වල මීට පෙර ගංවතුර මගින් හානි සිදු නොවූ අතර මේ තත්ත්වය මත එම කොට්ඨාශයේ අලුතින් ග්‍රාම සේවා වසම් 31ක් ඇතුළත් වීමත් සමඟ දිස්ත්‍රික්කයේ ගංවතුර ආපදා අවදානම් තත්ත්වය ඉහළ නැංවී ඇත. එමෙන්ම මෙම ගංගාවන් ආශ්‍රිතව ඇති සියලුම වසම් ආවරණය වන පරිදි කඩිනමින් දැනුවත් කිරිමේ වැඩසටහන් මෙන්ම සුරක්ෂිත මධ්‍යස්ථාන ස්ථාපිත කිරිම පිළිබඳ අවදානය යොමු කිරිම සිදු කල යුතුය. මෙහිදි දිස්ත්‍රික් ලේකම්ගේ උපදෙස් පරිදි කෑගල්ල දිස්ත්‍රික් ආපදා කළමනාකරණ සම්බන්ධීකරණ ඒකකය මගින් සම්බන්ධීකරණය සිදු කොට එහි වසම් 04ක් සඳහා එනම්, මකුද්දල, හැලමඩ, බටුවත්ත, ජීවාන ග්‍රාම සේවා වසම් සඳහා වට්ටාරම විහාරස්ථානය සුරක්ෂිත මධ්‍යස්ථානය ලෙස හඳුනා ගන්නා ලදි. අවශ්‍ය පහසුකම් මෙහි ප්‍රමාණවත් බව තවදුරටත් සඳහන් කරනු කැමැත්තෙමි.

මීට අමතරව හදිසි මුදවා ගැනිම් සඳහා කණ්ඩායම් සූදානම් කිරිමට අවශ්‍ය වන අතර මෙම ග්‍රාම සේවා වසම්වලට පිවිසෙන ප්‍රාදේශිය සහා මාර්ගයන්හි වර්ෂාව ඇතිවිමත් සමඟ ගංවතුර ආපදාවට ලක්වී ගමනාගමනය සඳහා දැඩි අපහසුතාවයන් පවති. මෙම තත්ත්වය මඟ හරහා ගැනිම සඳහා වසම් ආශ්‍රිතව අඟුල් ස්ථාපිත කිරිම හා අදාළ මුදවා ගැනිමේ උපකරණ ස්ථාපිත කිරිම අත්‍යාවශ්‍ය වේ.

*ඉදිරි සැළසුම්*

01. ආපදා කළමනාකරණය කිරිම සඳහා ක්ෂණිකව ඇතිවන ගංවතුර පූර්ව දැනුවත් කිරිමේ වැඩසටහන් ස්ථාපිත කිරිම.
02. විකල්ප මාර්ග හඳුනා ගැනිම.
03. මුදවා ගැනිම් කණ්ඩායම් හඳුනා ගැනිම හා ඔවුන් සම්බන්ධීකරණය.
04. ආපදා තත්ත්වයන්ට පත්වන ප්‍රජාව සුරක්ෂිත මධ්‍යස්ථාන වෙත යොමු කිරිම.
05. සුරක්ෂිත මධ්‍යස්ථාන හඳුනා ගැනිම හා පහසුකම් සකස් කිරිම.
06. ගංවතුරින් පසු අදාළ ළිං පිරිසිදු කිරිම.
07. සෞඛ්‍ය අංශ හා එක්ව සෞඛ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.
08. ආපදා අවදානම් ස්ථානයන්හි පූර්ව අනතුරු ඇඟවීමේ පුවරු ස්ථාපිත කිරිම.

යන කරුණු මත පදනම්ව ඉදිරියේදී පූර්ව දැනුවත් කිරිම හා පෙරසුදානම් වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට යෝජිතය.ඒ අනුව හඳුනාගන්නා ලද ග්‍රාම සේවා වසම් පහත දැක්වේ.

2020.5.15සහ 16 දින ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අධික වර්ෂාව නිසා ඇතිවූ හදිසි ජල ගැල්මෙන් පීඩාවට පත්වූ පවුල් සහ ගංගාවන් පිළිබඳ විස්තර

| අ. අ. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | ග්‍රාම නිලධාරි වසම | ආපදාවේ ස්වභාවය | බලපෑ ඇල/දොළ/ ගංඟාව | දිනය | පවුල් සංඛ්‍යාව | පුද්ගල සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| 1 | | මේපිල්ඩ් | | ගලිගමුව ඇල (අතුර ඇල මාර්ග) | | 7 | 21 |
| 2 | | බටුවත්ත | | හැලමඩ ඔය/කුඩා ඔය | | 21 | 88 |
| 3 | | ඇඳුරුපොත/නැ | | අධික වර්ෂාව | | 3 | 9 |
| 4 | | වේරගොඩ | | බටුවත්ත ඇල | | 6 | 19 |
| 5 | | දේවාලේගම | | ගල්ලැල්ල ඇල | | 9 | 19 |
| 6 | | බෝයගොඩ | | ගුරුගොඩ ඔය/බෝයගොඩ මහ ඇල | | 19 | 41 |
| | ගලිගමුව | ඇඳුරුපොත/බ | ගංවතුර | අධික වර්ෂාව | 2020.05.15 | 1 | 4 |
| 7 | | දමුණුපොල | | අධික වර්ෂාව | | 1 | 4 |
| 8 | | ලාහුපන | | ගුරුගොඩ ඔය | | 1 | 3 |
| 9 | | අලවල | | ගුරුගොඩ ඔය | | 5 | 22 |
| 10 | | නාරංගොඩ | | ගුරුගොඩ ඔය/බටේ ඇල | | 6 | 30 |
| 11 | | හොළොම්බුව | | ගුරුගොඩ ඔය | | 9 | 14 |
| 12 | | මකුද්දල | | අධික වර්ෂාව | | 1 | 5 |
| 13 | | හත්නාගොඩ | | කහගල්ලු ඔය | | 13 | 53 |
| 14 | | බිසෝවෙල | | කහඇල | | 4 | 8 |
| 15 | | යටිටෝගොඩ | | ගලිගමුව ඇල | | 74 | 161 |
| 16 | | පලපොළුවාව | | අධික වර්ෂාව | | 2 | 6 |
| 17 | | පානකාව | | අධික වර්ෂාව | | 2 | 7 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 18 | | අරන්දර | | ගුරුගොඩ ඔය | | 10 | 23 |
| 19 | | ගොඩපොල | | කුඩා ඔය | | 62 | 241 |
| 20 | | බල්ලාපාන උඩහාගේ | | ගලිගමුව ඇල | | 5 | 24 |
| 21 | | පෙහෙරඹේ | | ගලිගමුව ඇල | | 1 | 6 |
| 22 | | කිණිගම | | ගුරුගොඩ ඔය | | 12 | 41 |
| 23 | | හැලමඩ | | දංගොල්ල ඇල/කුඩා ඔය | | 50 | 150 |
| 24 | | ගලිගමුව | | ගලිගමුව ඇල | | 17 | 51 |
| 25 | | නවගමුව | | අධික වර්ෂාව | | 3 | 13 |
| 26 | | දෙමටංපිටිය | | කුඹුක්තොට ඇල/දෙමටංපිටිය ඇල | | 1 | 3 |
| 27 | | අම්පේ | | ගුරුගොඩ ඔය | | 1 | 2 |
| 28 | | නාඹේරියාව | | කුඹුක්තොට ඇල/දෙමටංපිටිය ඇල | | 1 | 4 |
| 29 | | බල්ලාපාන පාතහාගේ | | ගලිගමුව ඇල | | 3 | 5 |
| 30 | | කන්දෙගෙදර | | කන්දෙගෙදර ඇල | | 4 | 12 |
| 31 | | වලගම | | ගල්ලැල්ල ඇල | | 6 | 16 |
| 32 | | ජීවාන | | අධික වර්ෂාව | | 6 | 22 |
| 33 | | ආසිදෙණිය | | කුඹුක්තොට ඇල/දෙමටංපිටිය ඇල | | 2 | 4 |
| 34 | | රණපාන | | ගුරුගොඩ ඔය/අටුගොඩ ඇල | | 5 | 18 |
| 35 | | අටුගොඩ | | ගුරුගොඩ ඔය/අටුගොඩ ඇල | | 3 | 12 |
| **එකතුව** | | | | | | **376** | **1161** |

# ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ

## පූර්ව අනතුරු ඇඟවීමේ පුවරු සවිකල යුතු ග්‍රාම සේවා වසම්

| අ.අ | ග්‍රාම සේවා වසම | පූර්ව අනතුරු ඇඟවීමේ පුවරු සවිකළ යුතු ස්ථාන ගණන |
|---|---|---|
| 01 | අම්පෙ 63 | 02 |
| 02 | කුරුණෑගොඩ 63 B | 01 |
| 03 | බෝයගොඩ 65B | 01 |
| 04 | නාබෙරියාව 66 | 01 |
| 05 | අලවල 67 A | 02 |
| 06 | හොලොම්බුව 67 B | 02 |
| 07 | ගොඩපොල 76 | 06 |
| 08 | බටුවත්ත 76 A | 03 |
| 09 | හැලමඩ 76 B | 02 |
| 10 | පෙහෙරඹේ වසම 70 | 03 |
| 11 | යට්ටෝගොඩ 70 B | 04 |
| 12 | බල්ලපාන පාතභාගේ 70 C | 04 |
| 13 | බල්ලපාන උඩභාගේ 70 D | 02 |
| 14 | වේරගොඩ 73 A | 02 |
| 15 | දේවාලේගම 74 | 01 |
| | **එකතුව** | **36** |

ඒ  අනුව පහත සඳහන් පරිදි වැඩසටහන් යෝජනාව හා  පුවරුවේ දළ සැලැස්ම අවශ්‍ය කටයුතු සඳහා පහතින් දක්වා ඇත.




මීට අමතරව අදාළ ඇළ මාර්ගයන් ආශ්‍රිතව ජීවත්වන ප්‍රජාවගේ සුරක්ෂිතභාවය හා එම ප්‍රදේශය තුළ පාරිසරිකව ඇතිවන හානි වළක්වා ගැනිමේ අරමුණින් වාරිමාර්ග අමාත්‍යාංශය, ප්‍රාදේශිය සභාව, ප්‍රාදේශිය ලේකම් කාර්යාලය හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ඒකාබද්ධව වැඩසටහන් ක්‍රියාත්මක කිරිම මඟින් ඉදිරියේදී ඇතිවන ආපදා තත්ත්වයන් අවම කරගත හැකි බව සඳහන් කරමි.

ඉහත සඳහන් කරුණු අධ්‍යනය කර අදාළ පූර්ව දැනුවත් කිරිම් හා පෙරසුදානම් වැඩසටහන් මෙන්ම ඒකාබද්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරිම මඟින් මෙම ප්‍රදේශයේ ජනතාවගේ ජීවිත සුරක්ෂිත කිරිම සඳහා ආපදා තත්ත්වයන් කළමනාකරණ කිරිමට හැකි බව තවදුරටත් කාරුණිකව සඳහන් කරමි.

අනුෂ්ක චමිල,
සහකාර අධ්‍යක්ෂ(දිස්ත්‍රික්)

## අපේක්ෂිත වියදම් ඇස්තමේන්තුව

1. ශාඛා විධායක නිළධාරි, රතු කුරුස සංවිධානය, කෑගල්ල
2. අවධානය - ශාඛා විධායක නිළධාරි
3. ලිපි ගොනුව - පෙරසුදානම් සැළසුම් (DSK/DMC/KEG/PP-COM/A2/01)
4. වැඩසටහන් යෝජනාව හා අත්තිකාරම් මුදල් ඉල්ලීම.
   I. නම - අනතුරු ඇඟවීමේ පුවරු ස්ථාපිත කිරිම.
   II. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය -ගලිගමුව

5. **අවශ්‍ය මුදල** රු. 360,000.00

6. **ඉහත සඳහන් වැඩසටහන වෙනුවෙන් වියදම් කිරීමට අපේක්ෂිත ඇස්තමේන්තුව.**

| අංකය | විෂයාංකය | ඒකක ගණන | ඒකක මිල (රු.) | මුළු මුදල (රු.) |
|---|---|---|---|---|
| 1 | **දියේ ගිලීම් පූර්ව** අනතුරු ඇඟවීමේ පුවරු සකස් කිරීම. (3 ft x 2 ft one side වටේට යකඩ බාර් යොදා ඒ මත තහඩු සම්බන්ධ කර එහි මුද්‍රණය කරන ලද ස්ටිකර් ඇලවීම. ඒ මත ඇලුමිනියම් L බාර්ද යොදනු ලැබේ. හා අනතුරු ඇගවීමේ පුවරු සවිකිරීම. (9 1/2 ft උස අගල් 1හි GI බාර් යොදා පොලවට කොන්ක්‍රීට් දමා සවි කරනු ලැබේ.) | 36 | 10,000.00 | 360,000.00 |
| | | | **එකතුව** | **360,000.00** |

7.

| වැඩසටහනේ අපේක්ෂිත අරමුණ | ඇස්තමේන්තුගත කරන පරිදි අපේක්ෂිත මුදල (රු.) |
|---|---|
| ගංගා ආශ්‍රිතව සිදුවිය හැකි ආපදා තත්ත්වයන් පිළිබඳ දිස්ත්‍රික්කයේ මෙන්ම දිස්ත්‍රික්කයට පිටතින් පැමිණෙන ප්‍රජාවගේ ජීවිත හා දේපල සුරක්ෂිත කිරිම, මෙම දැනුවත් කිරිමේ පුවරු ස්ථාපිත කිරිම මඟින් අපේක්ෂා කෙරේ. | රු. 360,000.00 |

අනුෂ්ක චමිල,
සහකාර අධ්‍යක්ෂ,
කෑගල්ල දිස්ත්‍රික්කය.

දිනය - 2021.04.

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවට අනුමත කරමි.

දිස්ත්‍රික් ලේකම්/ අතිරේක දිස්ත්‍රික් ලේකම්/ සහකාර දිස්ත්‍රික් ලේකම්. දිනය - 2021.04
අත්සන හා රබර් මුද්‍රාව.